ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරග විභාගය 2013 ජුලි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை,2013 டிசெம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, July 2013

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிகக் கல்வியும் கணக்கீடும் I, II
**Business and Accounting Studies I, II**

පැය තුනයි
*Three hours*

10 ශ්‍රේණිය
*Grade 10*

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සැලකිය යුතුය :
(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) 1 සිට 40 තෙක් ප්‍රශ්න වල දී ඇති (1), (2), (3), (4) පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය මත (**x**) ලකුණ යොදන්න.
(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැළකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.

01 වුවමනා යනුවෙන් හඳුන්වනු ලබන්නේ,
1. මූලික තෘප්තින් ඉටුකර ගැනීම සඳහා මිනිසා තුල ඇති පෙළීමේ ස්වභාවයයි.
2. අවශ්‍යතා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූපයි.
3. ජීවිතය පවත්වා ගැනීමට අත්‍යවශ්‍යයෙන් සපුරා ගතයුතු දෑය.
4. මිනිසාට ජීවත් වීමට නැතිවම බැරි දෑ ය.

02. අවශ්‍යතා යනුවෙන් හඳුන්වන්නේ,
1. ව්‍යාපාර විසින් නිර්මාණය කරන්නා වු දෑය.
2. මූලික තෘප්තින් ඉටුකර ගැනීමට මිනිසා තුළ වන පෙළඹවීමේ ස්වභාවයයි.
3. වුවමනාවන් ඉටුකර ගැනීමට මිනිසා තුළ ඇති කැමැත්තයි.
4. වුවමනා සපුරා ගැනීමට යොදා ගන්නා විවිධ ස්වරූපයි.

03. නිෂ්පාදනය වර්ගීකරණයේ දී කාර්මික නිෂ්පාදනයට ඇතුළත් වන්නේ,
1. කෘෂි කර්මාන්තය 2. ධීවර කර්මාන්තය
3. පතල් හා කැණීම් 4. දැව හා වන

04. බෙදාහැරීමේ ක්‍රියාවලිය නිවැරදිව දක්වා ඇත්තේ,
1. නිෂ්පාදකයා → තොග වෙළෙන්දා → පාරිභෝගිකයා
2. තොග වෙළෙන්දා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා
3. නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → නියෝජිතයා → පාරිභෝගිකයා
4. නිෂ්පාදකයා → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

05. තොරතුරු තාක්ෂණයේ දියුණුවත් සමග සිදුවූ අවාසියකි.
1. පණිවිඩ ඉතා සුළු කාලයක දි සන්නිවේදනය කළහැකි වීම.
2. ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර භාවිතයෙන් සිදුවන වංචාවන් ඉහල යාම.
3. සාමාන්‍ය වෙළෙඳ පොල වෙනුවට ඉලෙක්ට්‍රොනික වෙළෙඳ පොල බිහිවීම.
4. මහා පරිමාණ කර්මාන්තශාලා බිහිවීම.

06. ව්‍යාපාර බිහිවීම සඳහා මූලික වුයේ,
1. පුද්ගල විශේෂීකරණය 2. භාණ්ඩ හුවමාරුව
3. මුදල් භාවිතය 4. කාර්මික විප්ලවය

07. ව්‍යාපාර පරිසරය යනුවෙන් හඳුන්වන්නේ,
1. ව්‍යාපාරයට පාලනය කල හැකි පරිසරයයි.
2. ව්‍යාපාරයට පාලනය කල නොහැකි පරිසරයයි.
3. ව්‍යාපාරයට බලපෑම් කළ හැකි සාධකයි.
4. අයිතිකරුවන් කළමණාකරුවන් හා සේවකයින් ය.

08. ආර්ථික පරිසරය තුළ ක්‍රියාත්මක වන සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
1. නූතන යන්ත්‍ර සූත්‍ර / යටිතල පහසුකම් / ව්‍යවසායකයන්
2. සිරිත් විරිත් / වයස් ව්‍යුහය / ජනගහනය
3. උද්ධමනය / පොලි අනුපාතය / මිල මට්ටම
4. කළමණාකරුවන් / සේවකයින් / අයිතිකරුවන්

09. භාණ්ඩ හුවමාරුව බිඳ වැටීමට හේතුවක් වනුයේ,
1. භාණ්ඩ කුඩා කොටස් වලට වෙන් කළ හැකි වීම
2. ද්විත්ව සමපාතය ගැලපීම
3. වටිනාකම මැනීමේ අපහසුතා
4. භාණ්ඩ පහසුවෙන් ප්‍රවාහනය කල හැකි වීම.

10. පහත දෑ අතුරින් ව්‍යාපාරයක ශක්තීන් ලෙස හඳුනා ගත හැක්කේ
1. හොඳ මූල්‍ය හැකියාව හා දුර්වල නායකත්වය
2. කළමණාකරණ නොහැකියාව හා දක්ෂ සේවකයින්
3. දැක්මක් තිබීම හා තීරණ ගැනීමේ දුර්වලතා
4. හොඳ සැලැස්මක් හා ඉදිරි දැක්මක් තිබීම

11. පොදු අංශයට අයත් ව්‍යාපාර සංවිධානයක් නොවන්නේ,
1. දෙපාර්තමේන්තු 2. සමුපකාර 3. සංස්ථා 4. රාජ්‍ය සමාගම්

12. ලාභ අරමුණුකර ගත් ව්‍යාපාර සංවිධානයකි.
1. සංස්ථාපිත සමාගම් 2. දෙපාර්තමේන්තු
3. සමිති 4. සමුපකාර

13 . හවුල් ව්‍යාපාරයක අවාසියක් ලෙස දැකිය හැක්කේ,
1. විවිධ හැකියාවන් ඇති පුද්ගල පිරිසකගේ එකතුවකි.
2. අන්‍යෝන්‍ය වගකීමට බැඳී සිටීම
3. පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
4. වැඩි ප්‍රාග්ධනයක් රැස්කර ගත හැකි වීම.

14. 2007 අංක 7 දරණ සමාගම් පණත බලපාන ව්‍යාපාර සංවිධාන වනුයේ,
1 සමුපකාර හා සංස්ථාපිත සමාගම්
2. සංස්ථා හා කේවල ස්වාමි ව්‍යාපාර
3. සංස්ථාපිත සමාගම් හා සංස්ථා
4. සංස්ථාපිත සමාගම් හා හවුල් ව්‍යාපාර

15. සමුපකාර සමිති ලියාපදිංචි කිරීමේදී සමුපකාර සංවර්ධන කොමසාරිස්ට භාර දියයුතු ලේඛණයකි.
1. සාංගමික ව්‍යවස්ථාවලිය 2. අතුරු ව්‍යවස්ථාවේ පිටපත්
3. අධ්‍යක්ෂවරුනගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය 4. ලේකම්ගේ කැමැත්ත ප්‍රකාශිත ලිපිය.

16. කේවල ස්වාමි ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ අවාසියකි.
1. පහසුවෙන් ආරම්භ කළ හැකි වීම 2. ලාභ තනිවම භුක්ති විඳිය හැකි වීම
3. ඉක්මන් තීරණ ගත හැකි වීම 4. නීතිමය පුද්ගලභාවයක් නොතිබීම.

17. සමුපකාර ව්‍යාපාරයක පවතින ලක්ෂණයක් වනුයේ,
1. ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් නොතිබීම
2. ප්‍රතිලාභ සාමාජිකයින් අතර බෙදී යාම.
3. ලාභ පරමාර්ථයෙන් කටුයුතු කිරීම.
4. සාමාජිකයින්ගේ සුභ සිද්ධිය නොතකා කටයුතු කිරීම.

18. පහත දක්වා ඇත්තේ ව්‍යාපාර කිහිපයක් සහ ඒවා ආරම්භ කිරීමට බලපත්‍ර ලබා ගතයුතු ආයතනයන්ය. එයින් නොගැලපෙන පිළිතුර වන්නේ,
1. බේකරි - සෞඛ්‍ය අමාත්‍යාංශය
2. කර්මාන්ත ශාලා - මධ්‍යම පරිසර අධිකාරිය
3. වාණිජ බැංකු - ශ්‍රී ලංකා මහ බැංකුව
4. බෙහෙත් ද්‍රව්‍ය අළෙවි ආයතන - සෞඛ්‍ය අමාත්‍යාංශය

19. ලියාපදිංචි කිරීමෙන් ව්‍යාපාරයකට ලබා ගත හැකි ප්‍රතිලාභයක් නොවන්නේ,
1. ව්‍යාපාරයට අනන්‍යතාවයක් ලැබීම
2. ව්‍යාපාරයට පිලිගැනීමක් ලැබීම
3. ණය ලබා ගැනීමට අපහසු වීම
4. නීතිමය රැකවරණය ලැබීම.

20. හවුල් ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමට අදාලවන පණත වනුයේ,
1. 1890 හවුල් ආඥා පණත 2. 1918 ව්‍යාපාර නාම පණත
3. පාරිභෝගික ආරක්ෂණ පණත 4. 2007 සමාගම් පණත

21. මහජනතාවට ප්‍රසිද්ධියේ කොටස් හෝ ණයකර නිකුත් කර ප්‍රාග්ධනය රැස්කර ගතහැකි ව්‍යාපාර සංවිධානය වන්නේ,
1. සීමිත පොදු සමාගම් 2. කේවල ස්වාමි ව්‍යාපාර
3. හවුල් ව්‍යාපාර 4. සීමිත පුද්ගලික සමාගම්

22. ව්‍යාපාරයකට මානව සම්පත අනිකුත් සම්පත් අතර විශේෂ වන්නේ,
    1. පහසුවෙන් පාලනය කළ හැකි වීම
    2. නිර්මාණශීලී වීම
    3. ඉක්මනින් ප්‍රතික්‍රියා නොදැක්වීම
    4. පුහුණුව තුළින් සංවර්ධනය කල නොහැකිවීම.

23. ව්‍යාපාර සැලැස්මක ඇතුළත් නොවනුයේ,
    1. අළෙවි සැලැස්ම 2. ආදායම් ප්‍රකාශය
    3. මෙහෙයුම් සැලැස්ම 4. මූල්‍ය සැලැස්ම

24. ව්‍යාපාර අයිතිකරුවන් ව්‍යාපාර ගිණුම් පිළිබඳ උනන්දුවක් දක්වනනේ,
    1. තීරණ වල නිවරදිතාවය පරීක්ෂා කිරීමට
    2. සේවක සුරක්ෂිතභාවය වැඩි කිරීමට
    3. මෙහෙයුම් ප්‍රතිඵල පිළිබඳ දැන ගැනීමට
    4. රජයට ගෙවිය යුතු ප්‍රමාණය තීරණය කිරීමට.

25. භාණ්ඩයක පිරිවැය ගණනය කිරීම සඳහා ව්‍යාපාරයකට වැදගත් වන්නේ,
    1. විකුණුම් මිල තීරණය කිරීම සඳහා
    2. වෙළෙඳ පොල ඉල්ලුම තීරණය කිරීමට
    3. ප්‍රචාරණය කල යුතුද නැද්ද තීරණය කිරීමට
    4. නිෂ්පදන ඒකක ගණණ තීරණය කිරීමට

26. ව්‍යාපාරයක මුළු පිරිවැය සමන්විත වනුයේ,
    1. ඍජු ද්‍රව්‍ය, ඍජු ශ්‍රමය, ඍජු වෙනත් පිරිවැය යනාදියෙන්
    2. වක්‍ර පිරිවැය හා පොදුකාර්ය පිරිවැය එකතුවෙනි.
    3. ද්‍රව්‍ය පිරිවැය, ශ්‍රම පිරිවැය, වෙනත් පිරිවැය ආදියෙනි.
    4. ඍජු පිරිවැය හා වක්‍ර ද්‍රව්‍ය පිරිවැයෙනි.

❖. පහත තොරතුරු ඇසුරෙන් 27, 28, 29 යන ප්‍රශ්ණ වලට පිළිතුරු සපයන්න.

පහත දැක්වෙනුයේ අල්මාරි නිෂ්පාදන ආයතනයකට අදාල තොරතුරු ය.

| | |
|---|---|
| දැව සඳහා | 100,000 |
| මුරකරු වැටුප | 7,000 |
| දුරකථන බිල | 2,500 |
| අල්මාරි නිපදවන්නාගේ වැටුප (එක් අල්මාරියක් සඳහා) | 1000 |
| ඇණ, වෙනත් | 12,500 |
| පොලිෂ් වර්ග | 5,000 |
| ලාභාන්තිකය විකණුම් මිලට | 20% |
| ඒකක ගණන | 10 |

27. අල්මාරි නිෂ්පාදනය සඳහා වූ ප්‍රාථමික පිරිවැය
    1. රු. 101,000 2. රු. 110,000 3. රු. 128,000 4. රු. 137,000


28. ඒකකයක නිෂ්පාදන පිරිවැය වනුයේ,
    1. රු. 10,100 2. රු. 11,000 3. රු. 12,800 4. රු. 13,700

29. එක් අල්මාරියක විකුණුම් මිල වනුයේ,
    1. රු. 16,440 2. රු. 2,740 3. රු. 17,125 4. රු. 15,360

30. ජංගම ගිණුම් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයාට ලැබෙන විශේෂ වාසියකි.
    1. ඉහල පොලියකට හිමිකම් කිව හැකි වීම
    2. අයිරා පහසුකම් ලැබීම
    3. බැංකු ගාස්තු අයකිරීම
    4. ප්‍රේෂණ රැස්කර ගත නොහැකිවීම

31. ජංගම ගිණුම් හිමියෙකුට බැංකුවෙන් සලසන සේවාවක් නොවන්නේ,
    1. තැන්පතු සඳහා පොලියක් හිමිවීම
    2. චෙක්පත් මගින් ගනුදෙනු කිරීමේ පහසුව
    3. බැංකු අයිරා පහසුකම්
    4. ගනුදෙනුකරුගේ ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම

32. පහත රේඛණ අතරින් විශේෂ රේඛණය වනුයේ,




(1) (2) (3) (4)

.

33. පිටසන් කිරීම යනුවෙන් හඳුන්වනුයේ,
   1. චෙක්පත පිටුපස බැංකුවක නමක් සටහන් කිරීමයි.
   2. චෙක්පත පිටුපස ආදායකයාගේ නිවැරදි නම සටහන් කිරීමයි.
   3. චෙක්පත පිටුපස ආදායකයාගේ නම මුහුනතේ දැක්වෙන ලෙස සටහන් කිරීමයි.
   4. චෙක්පත පිටුපස රේඛණයක් යෙදීමයි.

34. ටෙලර් කාඩ්පතක ඇතුළත් නොවන්නේ,
   1. ගිණුම් අංකය
   2. නිකුත් කළ දිනය
   3. බැංකුවේ නම
   4. කාඩ්පත් අංකය

35. තැන්පතු භාර ගන්නා ආයතනයකි.
   1. වණික් බැංකු
   2. මූල්‍ය සමාගම්
   3. කල්බදු සමාගම්
   4. මුදල් තැරැව්කාර ආයතන

36. ණයපතකින් ව්‍යාපාරිකයාට ඇති වාසියක් නොවන්නේ,
   1. ප්‍රමාද ණයට පොළී අයකිරීම
   2. ව්‍යාපාරිකයාගේ වෙළෙඳ පිරිවැටුම වැඩිවීම
   3. සොරසතුරු අවදානම අඩුවීම
   4. වැඩි මුදලක් ලග තබා ගැනීම අවශ්‍ය නොවීම.

37. බලපත්‍රලාභි විශේෂිත බැංකුවකට ගනුදෙනුකරුවන් සඳහා ඉටු කළ නොහැකි කාර්යයන් වනුයේ,
   1. ණය සැපයීමයි.
   2. ජංගම ගිණුම් පහසුකම් සැපයීමයි.
   3. ඉතුරුම් තැන්පතු භාර ගැනීමයි.
   4. කල්බදු පහසුකම් සැලසීමයි.

38. අන්තර්ජාලය හරහා සිදුකෙරෙන වෙළෙඳාම හඳුන්වන්නේ,
   1. විද්‍යුත් වාණිජ්‍ය ලෙස ය.
   2. විද්‍යුත් තැපැල ලෙස ය.
   3. විද්‍යුත් මුදල් ලෙස ය.
   4. විද්‍යුත් සන්නිවේදනය ලෙස ය.

39. වැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ව්‍යාපාරිකයෙකුට බැංකු ජංගම ගිණුමක් ඵලදායි ආයෝජන මාර්ගයකි.
   2. දිගුකාලීන ආයෝජන මාර්ගයක් වශයෙන් ස්ථාවර තැන්පත් ගිණුම් යෝග්‍ය වේ.
   3. ණයකර නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සපයා ගත හැක්කේ සීමිත පොදු සමාගම් වලට ය.
   4. භාණ්ඩාගාර බිලපත් හා භාණ්ඩාගාර බැඳුම්කර ඵලදායි ආයෝජන මාර්ග වේ.

40. ගෝලීයකරණය යනුවෙන් අදහස් කරනුයේ,
   1. මුළු ලෝකයම එකම වෙළෙඳ පොළක් බවට පරිවර්තනය වීමයි.
   2. භෞතික වශයෙන් ලෝකය කුඩා වීමේ ක්‍රියාවලියයි.
   3. මුළු ලෝකයටම පොදු වූ මුදල් වර්ගයක් භාවිත කිරීමයි.
   4. වෙළෙඳාම සඳහා රටවල් එකතු වී සංවිධානයක් පිහිටුවා ගැනීමයි.

සා.පෙළ ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයන දේශක
සිසිර කුමාර විසින් සම්පාදිත යි.